# රා කර්මාන්තය ආශ්‍රිත සාම්ප්‍රදායික භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් පයාගල ග්‍රාමය ඇසුරෙන්

*එම්.ඩබ්ලිව්.අයි.ඒ. සිල්වා*[1]

ලෝකයේ එක් එක් ප්‍රදේශයන්ට ආවේණික වූ ප්‍රාදේශික ආර්ථික කටයුතු දැකගත හැකි අතර ඒවා ගෝලීය, කලාපීය හා ප්‍රාදේශික මට්ටමින් හඳුනාගත හැකි ය. කිසියම් ප්‍රදේශයක පවතින දේශගුණය භූ විෂමත ආදි භූගෝලීය සාධක මෙන් ම මානව අවශ්‍යතා වෙළෙඳපොළ ආදි මානුෂ සාධකවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රාදේශික ආර්ථික කටයුතු ස්ථානගත වේ. ප්‍රාථමික ප්‍රාදේශීය ආර්ථික කටයුත්තක් වන රා කර්මාන්තය හා බැඳී ඇති විවිධ ක්‍රම උපායන් සිරිත් විරිත් පිළිබඳ ව අධ්‍යයනයක් කර ඔවුන්ට අනන්‍ය වූ ක්‍රමවේද පිළිබඳ ව ගවේෂණය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත භාවිත කරන ලදී. ක්ෂේත්‍ර නිරීක්ෂණය මඟින් හා ව්‍යූහගත හා අර්ධ ව්‍යූහගත සම්මුඛ සාකච්ඡා මගින් ප්‍රාථමික දත්ත එක් රැස් කළ අතර අන්තර්ජාලය හා පෙර ප්‍රකාශිත ලිපි අධ්‍යයනය කිරීමෙන් පර්යේෂණය සඳහා ද්විතීයක දත්ත ලබා ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපයේ පිහිටා ඇති කළුතර දිස්ත්‍රික්කයේ පයාගල ග්‍රාමය මෙම පර්යේෂණය සඳහා නියැදිය ලෙස තෝරා ගන්නා ලදී. පර්යේෂණය සඳහා සමස්ත ශ්‍රී ලංකාව ම නියෝජනය වන පරිදි එක් කුඩා ප්‍රදේශයක් තෝරා ගැනීමේ හේතුවෙන් මෙම පර්යේෂණයේ යම් සීමා දැකගත හැකි වේ. මෙම පර්යේෂණය ගුණාත්මක දත්ත මත පදනම් ව ගුණාත්මක ක්‍රමවේදයට සිදු කරන ලදී. එහි දී සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය භාවිත කරන ලදී. සාහිත්‍ය මූලාශ්‍රය අනුව අනුරාධපුර රාජධානියේ සිට පැවත එන කර්මාන්තයක් ලෙස රා කර්මාන්තය හැඳින්විය හැකි අතර පෘතුගීසි ආක්‍රමණයෙන් පසු ව මෙම කර්මාන්තය තවදුරටත් සංවර්ධනය විය. මෙම පර්යේෂණයේ දී රා කර්මාන්තයට සුවිශේෂී වූ ඔවුන්ට ආවේණික වූ ක්‍රමවේද හඳුනාගත හැකි විය. මෙම කර්මාන්තයේ මූලික පියවර ලෙස රා මැදීමට සුදුසු ලෙස ගස් කට්ටි (පොල් වතු) සකස් කර ගැනීමේ සිට මල් තැලීම,රා මැදීම, ප්‍රවාහනය, ගෙවීම් සිදු කිරීම ආදි සියලු අවස්ථාවල දී සාම්ප්‍රදායික ක්‍රමවේදයක් දැකගත හැකි විය. මෙම කර්මාන්තයට ආවේණික වූ ක්‍රමවේදයන් පිළිබඳ ව ගැඹුරු අධ්‍යයනයේ දී ඒ සියලු ක්‍රම විවිධ වූ හේතු සාධක හා අරමුණු මත පදනම් වී ඇති බව හඳුනාගත හැකි විය. නිදසුනක් වශයෙන් රා මැදීම සඳහා ගස් ඇඳීමේ දී භාවිත කෙරෙන ලණු දවසක් පමණ මුහුදෙහි පෙනෙන්නට තබා භාවිතයට ගනු ලබයි. එමගින් ලණුවල ශක්තිමත් භාවය හා දිගුකාලීන පැවැත්ම ඔවුන් විසින් අපේක්ෂා කරන ලදී. පරිසරය හා බැඳී පවතින මෙම කර්මාන්තයෙහි පරිසර හිතකාමී ක්‍රමෝපායන් දැකගත හැකි වූ අතර රා කර්මාන්තයේ දී මතු වන විවිධ ගැටලුවලට තිරසර ක්‍රම උපාය භාවිත කර ඇති අන්දම මෙම පර්යේෂණයෙන් දැකිය හැකි විය. ඒ අනුව, පොල් රා කර්මාන්තයේ සුවිශේෂී ඉපැරණි පරිසර හිතකාමී ක්‍රමෝපායන්හී භාවිතය දැකගත හැකි වූ බව මෙමඟින් නිගමනය කළ හැකි විය.

**ප්‍රමුඛ පද:** ඉපැරණි, ක්‍රමෝපායන්, පරිසර හිතකාමි, පොල්, රා කර්මාන්තය

---

[1] මානවශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය 2000miangelsilva@gmail.com